# ධර්ම සන්නිවේදන ක්‍රියාවලියෙහි සුභාවිත ඉගැන්වීමේ ක්‍රමවේදඃ පෙළ දහම ඇසුරින් අධ්‍යයනයක්

# Teaching Methods Used in Dhamma Communication Process: Through the Study of Tripitaka

මඩුගල්ලේ සුදත්ත හිමි

## Abstract

Teaching methodologies are crucial for the effectiveness of the teaching-learning process. Students assimilate subject-related learning outcomes through a variety of teaching methods that are primarily classified as student-centred and teacher-centred approaches. In accordance with Sutta analysis, to convey the message of the Buddha, diverse teaching methods have been employed by the Buddha himself concerning the diversity and capacity of both mental and physical strength of the followers through conversation, observation, and penetration of the minds of others. The salient notion of the research is to identify these methods and comparatively elaborate them based on modern teaching methods. To achieve this goal, the study employs the content analysis method, a subtype of qualitative research methodology. While studying the Pali canon as the primary source, a collection of selected Buddhist and Western secondary sources will be used in order to understand the effectiveness of applied Buddhist methods in the context of the modern education system. On top of the above opinion, the research identifies diverse teaching methods: lecture method, questioning method, discussion method, brainstorming method, step method, problem-based method, puzzle method, and practical method as utilized by the Buddha for the perfection of his Dhamma Communication Process. These methods possess ever-enduring

value and are easily applicable to any teaching and learning context. Consequently, these timeless methods can be effectively integrated into the teaching and learning processes. Moreover, these distinctive teaching methods can be effectively integrated with modern educational approaches in achieving the success of teaching-learning outcomes.

**Keywords:** Dhamma Communication, Teaching and Learning Process, Teaching Methods, The Load Buddha, Pali Canon, Modern Education

**හැඳින්වීම**

පුද්ගලයාගේ පැවැත්ම පිළිබඳ අවශ්‍ය පැහැදිලි කිරීම් සැපයීම, සාරධර්ම හා සදාචාරාත්මක මග පෙන්වීමක් ලබා දීම, ප්‍රජාව පිළිබඳ හැඟීමක් පෝෂණය කිරීම, ආධ්‍යාත්මික වර්ධනයට පහසුකම් සැලසීම සහ සමාජය තුළ සදාචාරාත්මක හා සංස්කෘතික රාමුවක් ස්ථාපිත කිරීමට දායක වීම ආගමක හෝ දර්ශනයක ප්‍රධාන අරමුණ වේ. එය ජනයාට සම්ප්‍රේෂණය කරන ආකාරය පිළිබඳ විමසීමේ දී විවිධ ඉගැන්වීම් ක්‍රමවේද හඳුනා ගත හැකි අතර ඒවා ශික්ෂණ විද්‍යාත්මක වටිනාකමකින් යුක්ත ය. එලෙස අධ්‍යාපනිකමය වශයෙන් වැදගත් ඉගැන්වීම් ක්‍රම සෑම ආගමික චින්තනයක ම හඳුනාගත හැකි අතර බුදුරජාණන් වහන්සේ ද එවැනි ඉගැන්වීම් ක්‍රමවේද රාශියක් ධර්ම සන්නිවේදනයෙහි භාවිත කර ඇති බව පෙළ දහම අධ්‍යයනයෙන් අනාවරණය වේ. ධර්ම සන්නිවේදනය යන්නෙන් මෙහිදී අදහස් කරනුයේ බුදුන් වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මය ස්වකීය ශ්‍රාවකයන්ට දැනුවත් වීම උදෙසා මනාව දේශනා කිරීමයි.

නූතන අධ්‍යාපන විද්‍යා ක්ෂේත්‍රය තුළ නව ඉගෙනුම් ක්‍රම, ඉගැන්වීම් ක්‍රම හා ඇගයුම් ක්‍රම විවිධ අධ්‍යාපනඥයින් විසින් ඉදිරිපත් කර ඇත. නමුත් මෙම ක්‍රමවේද අඩුවැඩි වශයෙන් විවිධ ආගමික ඉගැන්වීම්වල දී ද හඳුනාගත හැකිය. මින් වසර 2500කට පමණ පෙර ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් ද ධර්ම සන්නිවේදනයෙහි ලා භාවිත කරන ලද ඉගෙනුම් ක්‍රම හා ඉගැන්වීම් ක්‍රම මෙන් ම ඇගයීම් ක්‍රම ද විශාල ප්‍රමාණයක් හඳුනා ගත හැකිය. ඒ අතරින් මෙම ශාස්ත්‍රීය

අධ්‍යයනයේ දී බුදුන් වහන්සේ විසින් ධර්ම සන්නිවේදනයේ දී භාවිත කරන ලද ඉගැන්වීම් ක්‍රම කවරේ ද යන්න අනාවරණය කිරීමට අපේක්ෂා කෙරේ.

**සාහිත්‍ය විමර්ශනය**

බුදු දහම තුළ පැනෙන ආධ්‍යාපනික ලක්ෂණ පිළිබඳ විවිධ දේශීය හා විදේශීය කර්තෘවරුන් විසින් රචිත ශාස්ත්‍රීය පර්යේෂණ, කෘති සමූහයක් හඳුනාගත හැකිය. එම ශාස්ත්‍රීය ලේඛනවල දී බෞද්ධ අධ්‍යාපන සංකල්පය, එහි ආරම්භය හා විකාශය, අරමුණු හා පරමාර්ථ, ඉගැන්වීම් ක්‍රමවේද ආදි විවිධ ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කර ඇත.

හැවැන්පොල රතනසාර හිමි (1969) විසින් කෘත 'බෞද්ධ අධ්‍යාපන දර්ශනය' නම් කෘතියේ බුදුන් වහන්සේ භාවිත කළ ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ විස්තරයක් ද බඹරැන්දේ සිරිසීවලී හිමි (2003) විසින් රචනා කරන ලද 'අධ්‍යයන කලාව' නම් කෘතියේ බුදුන් වහන්සේ භාවිත කරන ලද ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ දළ විස්තරයක් ද ඇතුළත් වේ. පාතේගම ඤාණිස්සර හිමි (2006) විසින් රචිත 'බෞද්ධ අධ්‍යාපන ප්‍රවේශය' නම් කෘතියේ දී බෞද්ධ අධ්‍යාපන නිර්වචනයේ සිට අධ්‍යාපනය පිළිබඳ බෞද්ධ විවරණය, බෞද්ධ අධ්‍යයන විෂය මාලාව, බෞද්ධ අධ්‍යාපනයේ අරමුණු සහ පරමාර්ථ, නූතන තාක්ෂණික සහ විද්‍යාවේ දියුණුවත් සමග අධ්‍යාපනයේ මූලික හරයන් වෙනස් වීම, බුදුරජාණන් වහන්සේගේ අවධියේ පටන් බෞද්ධ අධ්‍යාපනයේ ස්වභාවය හා ඓතිහාසික විකාශය ද විවරණය කොට තිබේ.

පැලැන්වත්තේ ධම්මතිලක හිමි (2017) විසින් රචිත 'බෞද්ධ අධ්‍යාපන දර්ශනය' කෘතියේ දී බෞද්ධ අධ්‍යාපනයේ දාර්ශනික පදනම, ඉගැන්වීම සහ ඉගෙනීම පිළිබඳ බෞද්ධ චින්තනය, බෞද්ධ අධ්‍යාපන අරමුණු ආදි ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කර ඇත. 'සම්බුද්ධ දේශන විලාසය' නමින් දොරලියද්දේ ධම්මකිත්ති හිමි (2006) විසින් කරන ලද කෘතියේ දී බෞද්ධ අධ්‍යාපනයේ විද්‍යමාන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම පිළිබඳ විස්තර ඇතුළත් කර ඇත. එමෙන් ම චන්ද්‍රා ජයකොඩි (2005) විසින් කරන ලද 'බුද්ධ දේශනාවෙන් ඉගැන්වෙන අධ්‍යාපන ක්‍රම ශිල්ප' නම් කෘතියේ ද බුදුන් වහන්සේ විසින් භාවිත

කරන ලද ඉගැන්වීම් ක්‍රමශිල්ප පිළිබඳ කරුණු විවරණය කර ඇත. 'බුදු දහමින් පිළිබිඹු වන ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම' නමින් ඇකිරියගල නන්ද හිමියන් (1999) විසින් කරන ලද කෘතියේ බුදුරජාණන් වහන්සේ භාවිත කළ ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම තුන්වන පරිච්ඡේදයේ දී විස්තර කර ඇත. හැරී අබේසේකර හා විනීතා අබේසේකර (2015) විසින් කරන ලද 'බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ඉගැන්වීම් ක්‍රම' නම් ග්‍රන්ථයේ පරිච්ඡේද ගණනාවක් පුරාවට ඉගැන්වීම් ක්‍රම පිළිබඳ විස්තර ඉදිරිපත් කර ඇත.

පූර්වෝක්ත පොතපතින් හා වෙනත් පොතපතින් අනාවරණිත දත්ත සහ ප්‍රාථමික මූලාශ්‍ර ද අධ්‍යයනය කරමින් සාහිත්‍ය විමර්ශනාත්මකව මෙය සම්පාදනය කරන හෙයින් සාහිත්‍ය විමර්ශනයට අදාළ තොරතුරු ස්වල්පයක් පමණක් මෙහි ඉදිරිපත් කර ඇත.

**පර්යේෂණ ගැටලුව**

බුදුරජාණන් වහන්සේ ධර්ම සන්නිවේදනයේ දී අනුගමනය කරන ලද ඉගැන්වීම් ක්‍රමවේද කවරේදැ'යි හඳුනාගැනීම පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ අරමුණු**

මෙම අධ්‍යයනයේ දී බුදුන් වහන්සේ ධර්ම සන්නිවේදනයේ දී භාවිත කරන ලද ඉගැන්වීම් ක්‍රම කවරාකාර ද යන්න අනාවරණය කර, ඒවා නූතන අධ්‍යාපන පද්ධතිය තුළ භාවිත ඉගැන්වීම් ක්‍රම සමග තුලනාත්මකව සසඳමින් විස්තර කිරීම ප්‍රධාන අරමුණ වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයේ උපප්‍රභේදයක් වන ග්‍රන්ථ සන්ධාර විශ්ලේෂණ ක්‍රමවේදයෙන් සිදු කරනු ලැබේ. ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියීක මූලාශ්‍රය විමර්ශනය කිරීමෙන් මෙම අධ්‍යයනය සිදු කරන අතර ප්‍රාථමික මූලාශ්‍රය ලෙස පෙළ දහම අධ්‍යයනය කිරීමත්, ද්විතීයික මූලාශ්‍රය ලෙස සමගාමීව ලිය වී ඇති

ද්විතීයික ග්‍රන්ථ හා සමගාමී පර්යේෂණයන් අධ්‍යයනයත් සිදු කරනු ලැබේ. එනයින් බුදුන් වහන්සේ භාවිත කරන ලද ඉගැන්වීම් ක්‍රමවේද කවරේ ද? ඒවා යොදා ගෙන ඇති ආකාරය හා අවස්ථාවෝචිත බව කවරාකාර ද යන්න අධ්‍යයනය කිරීමට ග්‍රන්ථ සන්ධාර විශ්ලේෂණ ක්‍රමය යොදා ගෙන ඇත.

**පර්යේෂණයේ වැදගත්කම**

බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ දේශීය වශයෙන් හෝ විදේශීය වශයෙන් අවධානය යොමු වීම ඉතා අවම මට්ටමක පවතී. බුදු දහමේ ඇති මූලික අධ්‍යාපන සංකල්ප තවමත් ලෝකයට අධ්‍යාපන ක්ෂේත්‍රයට විවර වී ඇත්තේ සීමිත ප්‍රමාණයකි. එහෙයින් මෙම අධ්‍යයනයේ දී බුදුන් වහන්සේ විසින් භාවිත කරන ලද විවිධ ඉගැන්වීම් ක්‍රම හා ඒවා යොදා ගෙන ඇති අවස්ථාවන් පිළිබඳ අධ්‍යයනය කොට නූතන අධ්‍යාපන පද්ධතියට යොදා ගැනීමට හැකි වන පරිදි අනාවරණය කිරීමට බලාපොරොත්තු වේ. ඒ තුළින් අධ්‍යාපනයෙහි නියුතු ගුරුවරුන්ට විවිධ ඉගැන්වීම් ක්‍රමවේද හඳුනා ගෙන ඉගැන්වීම් කාර්යය තවදුරටත් සංවර්ධනය කර ගැනීමේ හැකියාව පවතින අතර ම අවස්ථානුකූලව ඒවා යොදා ගත හැකි ආකාරය පිළිබඳ ව ද ආදර්ශ ගත හැකි වේ.

එමෙන් ම, බුදු දහමේ මූලික ඉගැන්වීම් ද එහි සුවිශේෂත්වය ද ශාස්ත්‍රීය ලෝකයට අනාවරණය වේ. දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙන් ද මේ හා සමානව සිදු වී ඇති පර්යේෂණ අවම මට්ටමක පවතින හෙයින් මෙම අධ්‍යයනය, අධ්‍යාපන පද්ධතියට මෙන් ම බුදු දහම ගවේෂණයේ නියුතු වූවන්ට ද ශාස්ත්‍රීය ලෝකයට ද ගුරුවරුන්ට ද බෙහෙවින් උපයෝගී වනු ඇත.

**සාකච්ඡාව**

**ඉගැන්වීම් ක්‍රම තෝරා ගැනීමේ පදනම හා සුවිශේෂත්වය**

සත්ත්වයා නිර්වාණයට පැමිණවීම නිෂ්ඨාව කරගත් බෞද්ධ දර්ශනය තුළ අනුගාමිකයන්ට අවශ්‍ය උපදෙස්, අනුශාසනා, ඉගැන්වීම සිදු කිරීමෙහි පුරෝගාමියා වනුයේ බුදුරජාණන් වහන්සේ ය. ගම් නියම්ගම් වැඩමවමින් සහ තමන් සමීපයට පැමිණෙන ශ්‍රාවකයන්ට

ස්ව බුද්ධියෙන් සාක්ෂාත් කරගත් ධර්මය සන්නිවේදනය උදෙසා විවිධ ආකාරයේ ක්‍රම අනුගමනය කරන ලද බව හඳුනාගත හැකිය. එහිදි විශේෂයෙන් ම ශ්‍රාවකයාගේ කායික යෝග්‍යතාව හා මානසික යෝග්‍යතාව කෙටි පිළිසඳර ක්‍රමය, නිරීක්‍ෂණය, පරචිත්ත විජානන ඥානය තුළින් විමසා බලා ඒ ඒ චරිත ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් උචිත ක්‍රම යොදා ගෙන ඇති බව පෙළ දහම අධ්‍යයනයෙන් අනාවරණ වේ.

කුසගින්නෙන් පැමිණි ගොවියෙකුට ආහාර ලබා දීමෙන් පසු ධර්මය දේශනා කිරීම, පූතිගතතිස්ස තෙරුන් උණු පැනින් නහවා සිවුරු සෝදා කායික යෝග්‍යතාව සකසා දහම් දෙසීම ආදිය කායික යෝග්‍යතාව විමසා බලා දහම් දෙසීමේ අවස්ථාවන්ය. කායික අවශ්‍යතා මෙන් ම මානසික අවශ්‍යතා කෙරෙහි ද ඉගැන්වීමක දී අවධානය යොමු කළ යුතුමය. එයින් ග්‍රාහක ශක්තිය හඳුනා ගන්නා අතර ඒ අනුව ධර්ම දේශනා කරනු ලැබේ. ඒ අනුව බුදුන් වහන්සේ මානසික ලක්‍ෂණ අනුව පුද්ගල චරිත හයක් (ඛු.නි., චූල්ලනිද්දෙසපාළි, මෝඝරාජ සුත්ත නිද්දෙස, 2006ඃ 374) දක්වා ඇත.

| | |
|---|---|
| රාග | සද්ධා |
| ද්වේෂ | බුද්ධි |
| මෝහ | විතක්ක |

මෙම චරිත හය පිළිබඳ අවධානය යොමු කරමින් විනේය ජනයා හික්මවනු වස් අනුචිත ඉගැන්වීම් ක්‍රමවේද යොදා ගන්නා ලදී. එමෙන් ම ඉගෙන ගන්නා ආකාරය අනුව ද පුද්ගල වර්ගීකරණයක් ඤෙය්‍ය පුද්ගල සූත්‍රයෙහි (අ.නි., චතුක්කනිපාත, 2006ඃ 260) දක්වා ඇත.

උග්ඝටිතඤ්ඤූ

විපචිතඤ්ඤූ

ඤෙය්‍ය

පදපරම

එම පුද්ගලයන්ට අනුව උචිත ක්‍රම තෝරා ගත් ආකාරය ද පෙළ දහමින් හඳුනාගත හැකිය.

නූතන ශික්ෂණ විද්‍යාත්මක ක්‍රමවේදවල දී ද ඉගෙනුම්ලාභියාගේ මනෝවිද්‍යාත්මක, සමාජවිද්‍යාත්මක හා දාර්ශනික පසුබිම පිළිබඳ අධ්‍යයනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කළ යුතු බව පිළිගන්නා අතර එයින් ශිෂ්‍යයා හඳුනා ගැනීම අත්‍යවශ්‍ය කාරණාවක් ලෙස දක්වා ඇත.

සිල්වි සේනාධීර හා ශාමින්ද වනසිංහ (2006) ශිෂ්‍යයා හඳුනා ගැනීම පිළිබඳ ජෝන් ඩුවී දක්වන අදහස පහත ආකාරයෙන් දක්වා ඇත.

''ළමයා ගැන හෝ සමාජය ගැන නොසලකා උගන්වන ගුරුවරයා, පස හා දේශගුණය නොසලකා ගොවිතැන් කරන ගොවියාට සමාන කර දක්වයි.'' මෙයින් පැහැදිලි වනුයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍ය මානසිකත්වය හඳුනා ගැනීමේ වැදගත්කමයි.

''ගුරුවරයා ජෝන්ට ලතින් ඉගැන්වීමට සූදානම් වන්නේ නම් ලතින් ගැන මෙන් ම ජෝන් ගැන ද දත යුතුය'' (සේනාධීර හා වනසිංහ, 2006) යන ජෝන් ඇඩම්ස් නම් අධ්‍යාපනඥයාගේ අදහසින් ද ශිෂ්‍ය ස්වභාවය හඳුනා ගැනීමේ වැදගත්කම පැහැදිලි වේ.

මේ ආදි කරුණු විමර්ශනයෙන් පැහැදිලි වන්නේ බුදුන් වහන්සේ ස්වයං ප්‍රත්‍යක්ෂ ධර්මය සන්නිවේදනය උදෙසා ශිෂ්‍ය කායික හා මානසික ස්වභාවය දෙස අවධානය යොමු කරමින් විවිධ ඉගැන්වීම් ක්‍රම යොදා ගෙන ඇති බවයි.

සර්වකාලීන අගයකින් යුක්ත වීම එම ඉගැන්වීම් ක්‍රමවේදවල විශේෂත්වයයි. මීට වසර 2600 ට පමණ පෙර යොදා ගත් ඉගැන්වීම් ක්‍රම වර්තමානය වන විට ද ගැටලුවකින් බාධාවකින් තොරව භාවිත කළ හැකි වීමෙන් එය තහවුරු වේ. එමෙන් ම 'ඕනෑම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයක වැදගත්කම මැනෙන්නේ ඒවායේ සරල බව හා පහසුවෙන් භාවිත කිරීමේ ප්‍රවණතාවයත්, හැකියාවත්, ඒවායින් ලැබෙන උසස් ඵලයත් මතයි' (අබේසේකර හා අබේසේකර,

2015) යන ප්‍රකාශයෙන් පැහැදිලි වන ලෙස බුදුන් වහන්සේ විසින් අනුගමනය කරන ලද ඉගැන්වීම් ක්‍රම සියල්ල ම ඕනෑම මොහොතක හා අවස්ථාවක භාවිත කළ හැකි සරල හා පහසුතාවෙන් යුක්තය. එලෙස බුදුන් වහන්සේ විසින් භාවිත ඉගැන්වීම් ක්‍රමවල සරල බව හා පහසු බව, ඕනෑ ම කාලයක දී භාවිත කළ හැකි වීම, පුද්ගල විවිධත්වය අනුව යොදා ගැනීමේ හැකියාව ආදිය නිසා ඒවා සුවිශේෂ වේ.

**බුදුන් වහන්සේ භාවිත කළ ඉගැන්වීම් ක්‍රම**

ග්‍රාහකයාගේ කායික හා මානසික ස්වභාවයන් පදනම් කර ගෙන විවිධ ධර්ම සන්නිවේදන ක්‍රම බුදුන් වහන්සේ විසින් අනුග මනය කර ඇති අයුරු හඳුනාගත හැකිය.

**දේශන ක්‍රමය**

බොහෝ අවබෝධ කරගත් හෝ බොහෝ ශ්‍රවණය කළ අය සෙසු අයට දැනුම ලබා දීම සඳහා උපයෝගී කර ගත් පෞරාණික ක්‍රමයක් ලෙස දේශන ක්‍රමය හැඳින්විය හැකිය (කරුණාසේන, 2018). බොහෝ ආගමික නායකයින් ස්වයං අවබෝධිත දර්ශනය ශ්‍රාවකයන්ට ප්‍රචලිත කිරීමට මෙම දේශන ක්‍රමය උපයෝගී කර ගෙන ඇත. විෂය පිළිබඳ අවබෝධය ලත් අයෙක්, පිරිසක් හෝ කෙනෙක් ඉදිරියේ ප්‍රස්තුතය විස්තර කිරීම, පැහැදිලි කිරීම දේශනයක් වශයෙන් හැඳින්විය හැකිය (නන්ද හිමි, 1999). නූතනයේ යම් ආකාරයක ප්‍රතික්ෂේප වන ක්‍රමයක් ලෙස දේශන ක්‍රමය හඳුන්වන නමුත් මෙහි ලැබිය හැකි ප්‍රයෝජන බහුලය. එලෙස භාවිත කළ හැකි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

i. ඉගෙනුම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා

ii. සිසුන් පෙළඹවීම සඳහා

iii. පාඩම් ඒකක අවසානයේ කරුණු සාරාංශය සඳහා

iv. දුෂ්කර කරුණු සරලව අනාවරණය කරනු සඳහා

v. මාතෘකා අතර පරතරය පියවීම සඳහා

vi. වෙනත් මාර්ගවලින් ලද නොහැකි තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා

vii. විශාල පිරිසකට ඉගැන්වීම සඳහා (කුමාරපේලි, 2019)

ඒ අනුව බුදුන් වහන්සේ විසින් ද මෙවැනි අවස්ථාවල දී දේශන ක්‍රමය යොදා ගෙන ඇති අතර විශේෂයෙන් ම සර්වඥතා ඥානයෙන් යුතු නායකයෙක් ලෙස වෙනත් මාර්ගවලින් ලැබිය නොහැකි තොරතුරු ඉදිරිපත් කිරීමට දේශන ක්‍රමය යොදා ගෙන ඇත.

දේශනය ආරම්භය කරුණු හතරක් පදනම් කර ගෙන සිදු කර ඇති බව පෙළ දහමින් අනාවරණය වේ (මජ්ඣිමනිකායට්ඨකථා, සුත්ත නික්ඛෙපවණ්ණනා, 2006).

අත්තජ්ඣාසය ක්‍රමය (ස්ව අභිමතය මත දම් දෙසීම)

පරජ්ඣාසය ක්‍රමය (අනෙක් පුද්ගලයන්ගේ අදහස අනුව දම් දෙසීම)

පුච්ඡාවසික ක්‍රමය (අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් දම් දෙසීම)

අට්ඨුප්පත්තික ක්‍රමය (ශ්‍රාවකයන් අතර ඇති වූ කරුණක් පැහැදිලි කිරීමට දම් දෙසීම)

මෙම කරුණු පදනම් කරගෙන බුදුන් වහන්සේ දේශනාවන් සිදු කරන ලද අතර එම දේශනාවන් තුළ දී අනුගමනය කරන ලද කරුණු 7ක් හඳුනාගත හැකිය (ම.නි. III, සච්චවිභංග සුත්ත, 2006: 512).

i. ආචික්ඛනා (දේශනයේ දී කරන දෙය කෙටියෙන් හැඳින්වීම)

ii. දෙසනා (පැහැදිලි විස්තරයක් දීම)

iii. පඤ්ඤපනා (තේරුම් ගැනීමට සැලැස්වීම)

iv. පට්ඨපනා (ප්‍රස්තුත කරුණේ පිහිටුවීම)

v. විවරණ (හේතු දක්වමින් විස්තර කිරීම)

vi. විභජනා (කොටස්වලට බෙදමින් විස්තර කිරීම)

vii. උත්තානිකම්ම (නොගැඹුරු කොට සරල කොට දැක්වීම)

මෙම කරුණු හත අනුගමනය කරමින් බුදුන් වහන්සේ දේශන කරන ලද අතර එම දේශනාව මුල, මැද හා අවසානය යහපත් විය යුතුයැයි ද සලකන ලදී. 'දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං' (ස.නි., මාර සංයුක්ත, දුතියපාස සුත්ත, 2006: 192) යන පාඨයෙන් එය පැහැදිලි වේ.

බුදුන් වහන්සේ දේශන ක්‍රමය අවස්ථානුකූලව යොදා ගත් ආකාරය හඳුනාගත හැකිය. පළමු වතාවට දේශන ක්‍රමය යොදා ගත් අවස්ථාව දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවයි (ස.නි., සච්ච සංයුක්ත, ධම්මචක්කපවත්තන සුත්ත, 2006: 270-274). එම ක්‍රමයෙන් විශාල ප්‍රමාණයකට එකවර ධර්මය දේශනා කිරීමට හැකි වීමෙන් බුදු දහම විශාල ප්‍රදේශයක ප්‍රචලිත කිරීමට හැකියාව ලැබිණි. එය ඉතාමත් සාර්ථක වූ ආකාරය දේශනාව අවසානයේ ඇති ශ්‍රාවකයින්ගේ සතුට ප්‍රකාශ කිරීම්වලින් පැහැදිලි වේ (සු.නි., කසීභාරද්වාජ සුත්ත, 2006: 22-28, වසල සුත්තා: 36-42, ආලවක සුත්තා: 54-59).

**ප්‍රශ්නකරණය**

බුදුන් වහන්සේ ධර්ම සන්නිවේදනයේ දී බොහෝ අවස්ථාවල ප්‍රශ්නකරණය හෙවත් ප්‍රශ්නෝත්තර ක්‍රමය යොදා ගත් බව විවිධ සූත්‍ර දේශානවලින් ප්‍රකට වේ. මෙම ක්‍රමවේදය පැරණි දාර්ශනිකයෙකු වූ ඇරිස්ටෝටල් හා ප්ලේටෝ විසින් සත්‍ය ගවේෂණයෙහි ලා යොදා ගෙන ඇත. එයින් නියම යථාර්ථය එළිදැක්වීමට අවකාශ සැලසෙන හෙයින් සහ ගුරු-සිසු දෙපක්ෂය ම කාර්යක්ෂම වන හෙයින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කළ හැකි ඉතා යෝග්‍ය ක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය.

ප්‍රශ්නකරණයේ ප්‍රධාන අංශ දෙකකි (අබේසේකර සහ අබේසේකර, 2015).

1. ගුරුවරයා විසින් ප්‍රශ්න නැගීම

2. ශිෂ්‍යයා විසින් ප්‍රශ්න නැගීම

මෙම අංශ දෙකෙන් ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සක්‍රීය සහභාගීත්වයක් ලබා ගත හැකි නිසා ඉතා උසස් ක්‍රමයක් ලෙසින් නූතනයේ දී ද භාවිතයට ගැනේ.

බුදුන් වහන්සේ විසින් භාවිත කරන ලද ප්‍රශ්නෝත්තර ක්‍රමය තුළ දී අනුගමනය කරන ලද ක්‍රම හතරක් හඳුනාගත හැකිය (අ.නි., චතුක්ක නිපාත, පඤ්හව්‍යාකරණ සුත්ත, 2006: 90).

1. ඒකංස ව්‍යාකරණ (ප්‍රශ්නවලට සෘජුව ම පිළිතුරු දීම)

2. විභජ්ජ ව්‍යාකරණ (විභේදනය කොට පිළිතුරු දීම)

3. පටිපුච්ඡා ව්‍යාකරණ (ප්‍රතිප්‍රශ්න නගමින් ශිෂ්‍යයාගෙන් ම පිළිතුරු තහවුරු කිරීම)

4. ඨපනීය ව්‍යාකරණ (පිළිතුරු නොදී නිහඬව සිටීම)

මංගල සූත්‍රය (ඛු.නි., සුත්ත නිපාත, 2006: 80-82), ව්‍යග්ඝපජ්ජ සූත්‍රය (අං.නි., අට්ඨක නිපාත, 2006: 234-242), මහානාම සූත්‍රය (සං.නි., සොතාපත්ති සංයුක්ත, 2006: 182-191), ආලවක සූත්‍රය (ඛු.නි., සුත්ත නිපාත, 2006: 54-61), පරාභව සූත්‍රය (ඛු.නි. සුත්ත නිපාත, 2006: 30-37) වැනි සූත්‍රවල දී අනුගමනය කරන ලද ක්‍රම ඒකංස ව්‍යාකරණ හෙවත් ප්‍රශ්නවලට සෘජුව ම පිළිතුරු දීමකි.

විභජ්ජ ව්‍යාකරණය යනු අසන ලද ප්‍රශ්නය කොටස් ලෙසින් බෙදා වෙන් කරමින් පිළිතුරු ලබා දීමයි. බුදුන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී (අං.නි., අට්ඨක නිපාත, ව්‍යග්ඝපජ්ජ සුත්ත, 2006: 234-242) පිළිතුරු දෙන ආකාරය මෙයට කදිම නිදසුනකි.

''චත්තාරො මෙ ව්‍යග්ඝපජ්ජ, ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තන්ති දිට්ඨධම්මසුඛාය. කතමෙ චත්තාරො : උට්ඨානසම්පදා, ආරක්ඛසම්පදා, කල්‍යාණමිත්තතා, සමජීවිකතා. කතමා ච ව්‍යග්ඝපජ්ජ උට්ඨානසම්පදා....''

(ව්‍යාඝ්‍රපද්‍යය, මේ සතර දහම් කෙනෙක් කුලපුත්හුගේ ඉහාත්ම භාවයෙහි හිත පිණිස, ඉහාත්ම භාවයෙහි සුව පිණිස පවත්නාහ. කවර සතර දෙනෙක යත්: උට්ඨාන සම්පත් ය, ආරක්ෂා සම්පත් ය, කල්‍යාණමිත්‍රතාව ය, සමජීවිකතා ය යනුයි.

ව්‍යාඝ්‍රපද්‍යය, උට්ඨාන සම්පත් කවර යත්:

මෙලොව හිතසුව පිණිස පවතින්නා වූ කරුණු සතරක් දක්වා ඒවා නැවත කොටස් වශයෙන් විස්තර කිරීමක් මෙහිදී දැකිය හැකිය. මෙලෙසින් ඉදිරිපත් කරන ලද පිළිතුරු කොටස් වශයෙන් වෙන් කරමින් බෙදා දක්වමින් පිළිතුරු සැපයීම විභජ්ජ ව්‍යාකරණයේ දී සිදු වේ. ආළවක සූත්‍රය (ඛු.නි., සුත්ත නිපාත, 2006: 54-61), පහාරාද සූත්‍රය (අං.නි., අට්ඨක නිපාත, 2006: 82-92) මේ සඳහා තවත් උදාහරණයන්ය.

ප්‍රශ්නකරණයේ දී තවත් ක්‍රමයක් ලෙස ප්‍රතිප්‍රශ්න ක්‍රමය (පටිපුච්ඡා ව්‍යාකරණ) ද බුදුන් වහන්සේ භාවිත කර ඇත. උපාලි ගහපති දමනය (ම.නි. II, උපාලි සුත්ත, 2006: 60-82), කෙසි සූත්‍රය (අං.නි., චතුක්ක නිපාත, කෙසි සුත්ත, 2006: 218-221) මේ සඳහා නිදසුන් වේ. පැමිණි පුද්ගලයාගෙන් නැවත ප්‍රශ්න අසමින් ඔවුන්ගෙන් ම පිළිතුරු ලබා ගනිමින් කරුණු තහවුරු කිරීම මෙම ක්‍රමයේ දී සිදු වේ.

ඨපනීය ක්‍රමයේ දී බුදුන් වහන්සේගෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබා නොදී ඇතහැරීම සිදු කරයි. නිරර්ථක ප්‍රශ්නවල දී උන්වහන්සේ මෙම ක්‍රමය අනුගමනය කර ඇත. බුදු දහමේ මූලික අභිප්‍රාය පුද්ගලයා නිර්වාණය සඳහා යොමු කිරීමයි. එම අරමුණ ඉක්මවා ලෝකෝත්තර ප්‍රශ්නවල දී ඨපනීය වශයෙන් පිළිතුරු ලබා දුන් අවස්ථා සූත්‍ර දේශනාවලින් අනාවරණය වේ. චූලමාලුංඛ්‍ය සූත්‍රයේ දී ලෝකය පිළිබඳ අසන ප්‍රශ්නයට බුදුන් වහන්සේ පිළිතුරු ලබා නොදෙයි. (ම.නි. II, චූලමාලුංඛ්‍ය සුත්ත, 2006: 152-163)

''න හෙතං මාලුඞක්‍යපුත්ත, අත්‍ථසංහිතං, නාදිබ්‍රහ්මචරියකං, නෙතං නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. තස්මා තං මයා අබ්‍යාකතං.'' (මාලුඞ්ක්‍යපුත්‍රය, තෙල අර්ථසංහිත නො වෙයි. මඟ බඹසරට ආදි වූ ශීලමාත්‍ර ද නො වෙයි. මෙසෙයින් ඒ නිර්වේදය පිණිස නො වෙයි. විරාගය පිණිස නො වෙයි. නිරෝධය පිණිස නො වෙයි. ව්‍යුපශම පිණිස නො වෙයි. අභිඥා පිණිස නො වෙයි. සම්බෝධිය පිණිස නො වෙයි. නිර්වාණය පිණිස නො පවතී, එහෙයින් මා විසින් ඒ අව්‍යාකෘත වේ.)

මෙලෙසින් නිර්වාණය පිණිස හේතු නොවන නිසා පිළිතුරු ලබා නොදුන් අවස්ථා හඳුනාගත හැකිය.

ප්‍රශ්නකරණ ක්‍රමය භාවිතයෙන් ශ්‍රාවකයන් ධර්මාවබෝධය ලබාගත් ආකාරය සූත්‍ර දේශනාවසානයේ පැහැදිලි කිරීම්වලින් තහවුරු වේ. ''අත්තමනො ආයස්මා මාලුඞක්‍යපුත්තො භගවතො භාසිතං අභිනන්දීති'' (සතුටුසිත් ඇති ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්‍ර භාග්‍යවතුන්ගේ භාෂිතයට සතුටු වී යයි.) (ම.නි. II, චූලමාලුංඛ්‍ය සුත්ත, 2006: 162). බුදුන් වහන්සේ විසින් ප්‍රශ්නකරණය විවිධාකාරයෙන් භාවිත කර ඇති ආකාරයත් එයින් ශ්‍රාවකයන් ධර්මාවබෝධයට පත් වූ ආකාරයත් හඳුනාගත හැකිය.

**බුද්ධි කලම්බන ක්‍රමය**

'බුද්ධිය කැලැතීමට ලක් කරමින් පුද්ගල අදහස් ඉස්මතු කොට ගැනීම' බුද්ධි කලම්බන ක්‍රමවේදය නමින් හඳුන්වයි (අබේසේකර සහ අබේසේකර, 2015: 222). මෙම ක්‍රමවේදය ඉංග්‍රීසි භාෂාවෙන් 'Brain-storming' යනුවෙන් හඳුන්වයි. මෙම ක්‍රමය ද ප්‍රශ්නකරණය හා සමාන ක්‍රමයක් ලෙස හැඳින්විය හැකි වුවත් මෙහි ක්‍රියාදාමය එකිනෙක වෙනස් ය. මෙම ක්‍රමය භාවිතයෙන් ශිෂ්‍යයාගේ නිද්‍රෝපගත අදහස් ලබා ගැනීමට හැකි අතර බුද්ධියෙන් මුහුකුරා ගිය පිරිස ඉදිරියේ මෙය ඉතා සාර්ථක ක්‍රමයක් වේ. කිසියම් මාතෘකාවට අදාළ අදහස් සිසුන්ගෙන් ම ලබා ගන්නා අතර එය පාදක කරගෙන කරුණු සාරාංශ කර දැනුම ඒකාරාශී කරයි.

බුදුන් වහන්සේ පඨම මරණ සති සූත්‍රයේ දී (අං.නි., ඡක්ක නිපාත, පඨම මරණසති සුත්ත, 2006: 41-46) මෙම ක්‍රමය යොදා ගෙන ඇත. ''මරණසති භික්ඛවේ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසො අමතොගධා අමතපරියොසානා. භාවේථ නො තුම්හෙ භික්ඛවේ මරණසතින්ති ?'' (මහණෙනි, භාවිත, බහුලීකෘත, මරණසතිය මහත්ඵල මහානිශංස වෙයි, නිවන් පිහිට කොට ඇතියේ වෙයි. අමෘතපර්‍යයාවසාන කොට ඇතියේ වෙයි. මහණෙනි, තෙපි මරණ සති කමටහන් වඩන්නාහු නොවේ ද?)

මෙලෙසින් බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේ රැස්වී සිටිය මොහොතක මරණ සති කමටහන පිළිබඳ විමසමින් භික්ෂූන්ගේ බුද්ධිය කලම්බනයට ලක් කරයි. රැස් වී සිටි භික්ෂූන් වහන්සේ සියලු දෙනා ඒ සඳහා වෙන වෙන ම විවිධ පිළිතුරු ලබා දෙති. එයින් අවසානයේ ලැබෙන පිළිතුර පිළිබඳ එකඟතාවයකින් යුක්තව එම දේශනාව අවසන් කරති. මෙම ක්‍රමවේදය නූතනයේ හඳුන්වන බුද්ධි කලම්බන ක්‍රමවේදය ම වේ.

**සාකච්ඡා ක්‍රමය**

බුදුන් වහන්සේ විසින් භාවිත කරන ලද තවත් විශේෂ ඉගැන්වීම් ක්‍රමයක් ලෙස සාකච්ඡා ක්‍රමය දැක්විය හැකිය. 'ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත්ව ශිෂ්‍යයා හා ගුරුවරයා අතර කෙරෙන සම්භාෂණයක් හැටියට සාකච්ඡා ක්‍රමය ක්‍රියාත්මක වේ. මෙහි කාර්ය වනුයේ ශිෂ්‍යයාගේ අවධානය, වැදගත් කරුණු හා අත්දැකීම් හා ක්‍රියාවන් කෙරෙහි ඍජුව ම යොමු කරවීමයි.' (නන්ද හිමි, 1999) මෙලෙසින් පැහැදිලි වනුයේ දෙදෙනෙක් හෝ දෙපිරිසක් අතර ඇති වන සම්භාෂණය සාකච්ඡා ගණයට අයත් වන බවයි.

බුදුන් වහන්සේ විසින් ද මෙම ක්‍රමය භාවිත කර ඇති අතර එය විශේෂ ඇගයීමට ද ලක් කර ඇත. ''සාකච්ඡාය භික්ඛවේ පඤ්ඤා වෙදිතබ්බො'' (මහණෙනි, සාකච්ඡාවෙන් ප්‍රඥාව දත යුතුය) යනුවෙන් අංගුත්තර නිකායේ ඨාන සූත්‍රයේ (අං.නි., චතුක්ක නිපාත, 2006: 368-369) දී ඇතුළත් පාඨයෙන් එය වඩාත් පැහැදිලි වේ. වර්තමානයේ දී ගුරු-සිසු දෙපක්ෂයේ ම ක්‍රියාකාරිත්වය රඳා පවත්වා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දියත් කළ හැකි ක්‍රමයක් ලෙස සාකච්ඡා ක්‍රමය පිළිගැනේ.

අංගුත්තර නිකායේ උපක සූත්‍රය (අං.නි., චතුක්ක නිපාත, 2006: 352-353) සාකච්ඡා ක්‍රමය සඳහා නිදසුනකි. එහිදී බුදුන් වහන්සේ සමීපයට පැමිණෙන උපක ආජීවකයා හා බුදුන් වහන්සේ අතර ඇති වන සාකච්ඡාවක් හඳුනාගත හැකිය.

''අහං හි භන්තෙ එවංවාදී එවංදිට්ඨී : යො කොචි පරූපාරම්භං වත්තෙති. පරූපාරම්භං වත්තෙන්තො සබ්බො සො න උප්පාදෙති අනුප්පාදෙන්තො ගාරය්හො හොති උපවජ්ජොති.''

(වහන්ස, "මම යම් කිසිවෙක් පරගර්හා කියා ද, පරගර්හා කියන්නේ, එ හැම (කුසල්) සිදු නො කෙරේ, නොහොත් උපපාදනය (තම වචනය නිසි කිරීම) නො කෙරේ. උපපාදනය නො කරණුයේ, ගර්හණීය වේ. උපවාද කටයුතු ද වෙයි" යන මෙබඳු වාද ඇතියෙම්, මෙබඳු දෘෂ්ටි ඇතියෙම් වෙමි.)

යනුවෙන් උපක බුදුන් වහන්සේට සැල කරයි. ඉන් පසු බුදුන් වහන්සේ එයට පිළිතුරු ලබා දෙන අතර නැවත උපක ආජීවක තෙම ප්‍රශ්න කරයි. මෙලෙසින් දෙදෙනා අතර ඇති වන සාකච්ඡාවෙන් උපක ආජීවක තෙම සතුටු සිත් ඇති වූ බව සූත්‍ර දේශනාව අවසානයෙන් දක්වයි.

''අථ ඛො උපකො මණ්ඩිකාපුත්තො භගවතො භාසිතං අභිනන්දිත්‍වා අනුමොදිත්‍වා උට්ඨායාසනො භගවන්තං අභිවාදෙත්‍වා පදක්ඛිණං කත්‍වා...''

(ඉක්බිති මණ්ඩිකාපුත්‍ර උපක භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන්ව හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට...)

සූත්‍රාවසානයේ එන ප්‍රකාශයෙන් එම සාකච්ඡාවේ සාර්ථකත්වය පිළිබඳ පැහැදිලි වේ. මෙලෙස සාකච්ඡා ක්‍රමය භාවිත වන සූත්‍ර බහුලව හඳුනාගත හැකිය. පොට්ඨපාද සූත්‍රය (දී.නි. I, 2006: 388-437), වෙඛනස්ස සූත්‍රය (ම.නි. I, 2006: 394-403), කණ්ණකත්ථ, සූත්‍රය (ම.නි. I, 2006: 562-575) වැනි සූත්‍ර සාකච්ඡා ක්‍රමයට උදාහරණ ලෙස දැක්විය හැකිය.

**ගැටලු ක්‍රමය**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයාට කිසියම් ගැටලුවක් ලබා දී එය විසඳීමෙන් ඉගෙනුම්ඵල කරා යොමු කිරීම ගැටලු ක්‍රමය ලෙසින් හඳුන්වයි. 'ගැටලු පාදක ඉගෙනුම සිසුන්ගේ සත්‍ය ජීවිතයේ පවතින ගැටලුවලට විසඳුම් සෙවීම හෝ පිළිතුරු සෙවීමක් අපේක්ෂා කරයි... ගුරුවරයා හෝ උපදේශකවරයා සුසාධ්‍යකරුවෙකු ලෙස ක්‍රියාකරයි. එහෙත් සිසුන්ගේ පරීක්ෂණ සඳහා මග පෙන්වීමක් හෝ පාලනය කිරීමක් නොකරයි' (වෙස්ට්වුඩ්, 2008: 48). බුදුන් වහන්සේගේ දේශනා විමසීමෙන් ගැටලු ක්‍රමය මීට වසර 2600කට පෙර ද භාවිත කළ ඇති බව හඳුනාගත හැකිය.

අරියපරියෙසන සූත්‍රයේ දී (ම.නි. I, 2006: 394-425) පැහැදිලි කරන පරිදි සිදුහත් කුමාරයා සත්‍ය කුමක් ද? කුසලය කුමක්දැ'යි සොයමින් ගමන් කළ බව දැක්වෙන කරුණ ගැටලු පාදක ක්‍රමයට කදිම නිදසුනකි.

''සො එවං පබ්බජිතො සමානො කිං කුසලගවේසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො යෙන ආළාරො කාලාමො තෙනුපසඞකමිං.''

(ඒ මම මෙසේ පැවිදි වූයෙම් කුසලය කුමක්දැ'යි සොයන සුලුවූයෙම් නිරුත්තර වූ උතුම් වූ ශාන්තිපදය සොයමින් ආළාරකාලාම කරා පැමිණියෙමි.)

මෙහිදී කුසලය කුමක් ද? යන ගැටලුව පාදක කර ගෙන පර්යේෂණයක් ආරම්භ කරන සිදුහත් කුමරු එයින් සත්‍යාවබෝධය ලබා ගනී.

මහාපුණ්ණම සූත්‍රයේ දී (ම.නි. III, 2006: 116-125) ද එක්තරා භික්ෂුවකට ඇති වූ ගැටලුවක් පාදක කර ගෙන බුදුන් වහන්සේ සමීපයට පැමිණ එය විසඳා ගන්නා ආකාරය ද ගැටලු පාදක ක්‍රමය සඳහා උදාහරණයකි. මෙලෙසින් සූත්‍ර දේශනාවලින් බුදුන් වහන්සේ ධර්ම සන්නිවේදනය සඳහා ගැටලු ක්‍රමය ද යොදා ගත් ආකාරය අනාවරණය වේ.

**ප්‍රහේලිකා ක්‍රමය**

ගැටලු පාදක ක්‍රමයට සමාන ක්‍රමවේදයක් ලෙස ප්‍රහේලිකා ක්‍රමය හැඳින්විය හැකිය. මෙහිදී ද කිසියම් ආකාරය කුතුහලයකින් යුතුව ශිෂ්‍යයා කටයුතු කරන අතර එම සංසිද්ධිය ගැනීමට උත්සුක වේ. එයින් ඉගෙනීමට අවශ්‍ය උත්සාහය, උනන්දුව ඇති වේ. මෙලෙස ප්‍රහේලිකා ක්‍රමයට උදාහරණයක් ලෙස වම්මික සූත්‍රය (ම.නි. I, 2006: 354-361) දැක්විය හැකිය.

''භික්ඛු අයං වම්මිකො රත්තිං ධූපායති. දිවා පජ්ජලති.'' (මහණ මේ තුඹස රාත්‍රියෙහි දුම දමයි, දිවා ඇවිලෙයි.) ආදි වශයෙන් තුඹසක් පිළිබඳ ප්‍රහේලිකාවක් ඇති වන අතර පසුව ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් දැකිය හැකිය.

''යං ඛො භික්ඛු දිවා කම්මන්තෙ ආරබ්භ රත්තිං අනුවිතක්කෙති අනුවිචාරෙති, අයං රත්තිං ධූපායනා.''

(මහණ, දවාලෙහි කළ යුතු කර්මාන්තයන් අරභයා රෑ කල්පනා කරයි. විමසා බලයි, යන යමක් ඇද්ද, මෙය රෑ දුමාලීම යි.)

''යං ඛො භික්ඛු රත්තිං අනුවිතක්කෙත්වා අනුවිචාරෙත්වා දිවා කම්මන්තෙ පයොජෙති කායෙන වාචාය මනසා, අයං දිවා පජ්ජලනා.''

(මහණ, රාත්‍රියෙහි නැවත නැවත කල්පනා කොට, නැවත නැවත සිත හසුරුවා, දාවල්හි කයින් වචනයෙන් සිතින් කර්මාන්තයන් යොදයි, යන යමක් ඇද්ද, මේ දවල් දිලීම යි.)

උක්තාකාරයෙන් බුදුන් වහන්සේ පුද්ගලයාගේ ධර්මාවබෝධය වර්ධනය සඳහා ප්‍රහේලිකා ක්‍රමය ඉතාමත් සාර්ථකව යොදා ගෙන ඇති ආකාරය හඳුනා ගත හැකිය. කසීභාරද්වාජ සූත්‍රය (සු.නි., 2006: 22-29), වසල සූත්‍රය (සු.නි., 2006: 36-42) ආදි තැන්වල දී ද මෙම ක්‍රමය යොදා ගෙන ඇත.

**පියවර ක්‍රමය**

බී.එෆ්. ස්කිනර් විසින් පළමුව ඉදිරිපත් කරන ලදැ'යි සැලකෙන පියවර ක්‍රමය නූතනයේ ඉතා ශ්‍රේෂ්ඨ ඉගැන්වීම් ක්‍රමයක් ලෙස භාවිත වේ. මෙහි දී කිසියම් ඉගෙනුම්ඵලයක් කරා ශිෂ්‍යයා පියවරෙන් පියවර යොමු කරයි. සරල ඉගෙනීමක සිට ප්‍රශස්ත ඉගෙනීමක් දක්වා පියවරෙන් පියවර ඉගෙනීම සිදු වේ. මෙම ඉගැන්වීම් ක්‍රමය බුදුන් වහන්සේ විසින් ද භාවිත කර ඇති ආකාරය මනාව පැහැදිලි වේ.

බුදුන් වහන්සේ පහාරාද සූත්‍රයේ දී (අං.නි., අට්ඨක නිපාත, 2006: 82-92) දක්වන්නේ ධර්මාවබෝධය සඳහා යොමු විය යුත්තේ පියවරෙන් පියවර බවයි.

''සෙය්‍යථාපි පහාරාද මහාසමුද්දො අනුපුබ්බනින්නො අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො න ආයත කෙනෙව පපාතො. එවමෙව ඛො පහාරාද ඉමස්මිං ධම්මවිනයෙ අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා''

(පහාරාදය, යම් සේ මහසයුර අනුපූර්ව නිම්න ද, අනුපූර්ව ප්‍රවණ ද, අනුපූර්ව ප්‍රාග්භාර ද, ආදියෙහි ම නො ගැඹුරු වේ ද, පහාරාදය, එසෙයින් ම මේ ධර්ම විනයෙහි අනුපූර්ව ශික්ෂා වෙයි. අනුපූර්ව ක්‍රියා වෙයි. අනුපූර්ව ප්‍රතිපත් වෙයි.)

මෙලෙසින් බුදු දහමේ මූලික අභිප්‍රාය වන නිර්වාණය කරා පුද්ගලයා යොමු කිරීමේ මූලික ක්‍රියාවලිය කිසියම් පියවර අනුගතව සිදු වන බව පැහැදිලි වේ.

රථ විනීත සූත්‍රයෙහි (ම.නි. I, 2006: 362-373) එන සප්ත විසුද්ධිය පිළිබඳ පැහැදිලි කිරීමෙන් ද මෙම පියවර ක්‍රමය හඳුනා ගත හැකිය. සරල බවේ සිට ක්‍රමානුකූලව සංකීර්ණ බව දක්වා පුද්ගලයා යොමු කරන ආකාරය එහිදී වැදගත්ය.

''එවමෙව ඛො ආවුසො සීලවිසුද්ධි යාවදෙව චිත්තවිසුද්ධත්‍ථා. චිත්තවිසුද්ධි යාවදෙව දිට්ඨිවිසුද්ධත්‍ථා. දිට්ඨිවිසුද්ධි යාවදෙව කඞ්ඛාවිතරණවිසුද්ධත්‍ථා... අනුපාදාපරිනිබ්බානත්‍ථං ඛො ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සතීති.''

(ඇවැත්නි, මෙපරිද්දෙන් ම ශීලවිසුද්ධිය චිත්තවිසුද්ධිසඞ්ඛ්‍යාත අර්ථය දක්වා ම වෙයි. චිත්තවිසුද්ධිය දිට්ඨිවිසුද්ධිය දක්වා ම වෙයි. දිට්ඨිවිසුද්ධිය කඞ්ඛාවිතරණවිසුද්ධිය දක්වා ම වෙයි... ඇවැත්නි, අනුපාදාපරිනිර්වාණය (ප්‍රත්‍යයෙන් නූපන් අසඞ්ඛත ධාතු) සංඛ්‍යාත අර්ථය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වෙසෙයි.)

මෙහිදී සීල විසුද්ධියේ සිට පියවර හතක් ගමන් කරමින් නිර්වාණය කරා යොමු වන ආකාරය බුදුන් වහන්සේ මෙහිදී පැහැදිලි කර ඇත. සරල බවේ සිට සංකීර්ණ බව දක්වා පුද්ගලයා යොමු කරන ආකාරය පියවර ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණයකි. සීහසෙනාපති සූත්‍රය (අං.නි. පඤ්චක නිපාත, 2006: 60-63) ද පියවර ක්‍රමය සඳහා උදාහරණයකි. එහිදී බුදුන් වහන්සේ අනුපිළිවෙල කථාව එනම් දානකථා, සීලකථා, සග්ගකථා, කාමයන්ගේ ආදීනව හා ළාමක බව කිලිටි බව හා ඒවායින් මිදීමේ අනුසස් වදාළ ආකාරය හඳුනාගත හැකිය.

මෙම කරුණු අනුව බුදුන් වහන්සේ විසින් ධර්ම සන්නිවේදනය සඳහා පියවර ක්‍රමය යොදා ගෙන ඇති ආකාරය විශද වේ.

**ප්‍රායෝගික ක්‍රමය**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍ය ග්‍රහනය වැඩි කර ගැනීමට ඉගෙනුම්ඵල ශිෂ්‍යයා කරා යොමු කිරීමේ සාර්ථකම ක්‍රමය ලෙස ප්‍රායෝගික ක්‍රමය හැඳින්විය හැකිය. කිසියම් ඉගෙනීමක් පිළිබඳ ප්‍රායෝගික අවස්ථාවන් සඳහා ශිෂ්‍යයා යොමු කර එම අත්දැකීම් පාදක කර ගෙන ඉගැන්වීම මෙයින් සිදු වේ. එය අභ්‍යාස ක්‍රමය, ක්‍රියාකාරී අධ්‍යාපනය ආදි නම්වලින් ද හඳුන්වයි. අධ්‍යාපනය පිළිබඳ අදහස් දක්වන ජෝන්ඩුවී, රූසෝ, මාරියා මොන්ටිසෝරි, මහත්මා ගාන්ධි වැනි දාර්ශනිකයන් මෙම ක්‍රමය ඉතා ඉහළින් නිර්දේශ කරන අතර ඔවුන්ගේ දාර්ශනික ඉගැන්වීම්වල ඉගැන්වීම් ක්‍රමයක් ලෙස ද මෙය යෝජනා කර ඇත.

බුදු දහම තුළ ප්‍රායෝගික ක්‍රමය භාවිත අවස්ථාවක් ලෙස කිසා ගෝතමී තෙරණියට අබ මිටක් රැගෙන ඒමට අනුදැනීම දැක්විය හැකිය. තම පුතු මිය ගිය ශෝකයෙන් පෙළුණු කිසා ගෝතමී පුතු සුව

කර ගැනීම උදෙසා බුදුන් වහන්සේ වෙත එළඹි විට බුදුන් වහන්සේ පුතු සුව කිරීමට නොමළ ගෙයකින් අබ මිටක් රැගෙන එන ලෙස වදාළහ.

''න විජ්ජන්තෙ මතා යස්මිං ගෙහෙ සිද්ධත්ථකං තතො ආහාරා'ති ජිනො ආහ විනයොපායකොවිදො' (අපදානපාළි, කිසාගෝතමී අපදාන 2006: 120)

යනුවෙන් නොමළ ගෙයකින් අබ මිටක් රැගෙන ඒමට කිසා ගෝතමී යැවූ අතර එවැනි නිවසක් සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මරණය සියලු දෙනාටම පොදු ධර්මයක් ලෙස අවබෝධ කර ගනිමින් පැවිදි දිවියට පත්ව නොබෝ කාලයකින් අරහත් භාවයට පැමිණියා ය.

නන්ද කුමාරයාට ධර්මාවබෝධය ලබා දීම සඳහා ද බුදුන් වහන්සේ අනුගමනය කරන ලදුයේ, ප්‍රායෝගික ක්‍රමයයි. නන්ද කුමාරයා බුදුන් වහන්සේගේ ආයාචනය නිසාවෙන් පැවිදි වුව ද තමාගේ රූමත් බිරිඳ සිහිවීම නිසා ධර්මය සිහි කිරීමක් කිසිදු විටක සිදු නොවීය. මේ නිසාවෙන් බුදුන් වහන්සේ ආධාරකයක් ලෙස රූමත් දිව්‍යාංගනාවක් මවා ක්‍රමානුකූලව වියපත්ව වැහැරී යන ආකාරය මැවූ සේක.

''සකෙන ආනුභාවෙන ඉත්ථිං මාපෙසි සොභනිං දස්සනීයං සුරූපිනිං මමතොපි සුරූපිනිං'' (අපදානපාළි, නන්දා ජනපදකල්‍යාණී අපදානය, 2006: 134)

ආදි වශයෙන් දැක්වෙන පරිදි ඉතාමත් රුවැති ස්ත්‍රියක් මවා ක්‍රමානුකූලව වැහැරුණු ශරීරය ඇති කුණු දුගඳ පැතිරෙන කාන්තාවක් බවට ඇය පත් කොට ජීවිතයේ අනියත බව පසක් කරවන ලදී. එයින් නන්ද කුමාරයාගේ රාගික සිත මඬනා ලද්දේ, ධර්මයෙහි උත්සුක කරවීය.

මෙහිදී භාවිත කරන ලද ආධාරකය ලෙස, බුදුන් වහන්සේගේ ආනුභාවයෙන් රූමත් ස්ත්‍රී රුවක් මැවීම දැක්විය හැකිය. මෙලෙසින් බුදුන් වහන්සේ ශිෂ්‍යයා ප්‍රායෝගිකත්වයට සමීප කිරීමට විවිධ ක්‍රමවේද අනුගමනය කර ඇති බව සූත්‍ර දේශනා ආශ්‍රයෙන් විශද වේ.

**සමාලෝචනය**

බුදුන් වහන්සේ ධර්ම සන්නිවේදනයේ දී විවිධ ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කරන ලද ආකාරය සාකච්ඡාවේ දී අනාවරණය විය. නූතන අධ්‍යාපන විද්‍යාඥයින්, දාර්ශනිකයින්, මනෝවිද්‍යාඥයින් නව ක්‍රම ලෙස ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දුන්න ද මීට වසර 2600කට පමණ පෙර එම ක්‍රම බුදුන් වහන්සේ විසින් ප්‍රායෝගිකව භාවිත කළ අවස්ථාවන් හඳුනා ගත හැකිය. ඒ ක්‍රමවේද අතර දේශන ක්‍රමය, ප්‍රශ්නකරණය, සාකච්ඡා ක්‍රමය, බුද්ධි කලම්බන ක්‍රමය, පියවර ක්‍රමය, ගැටලු ක්‍රමය, ප්‍රහේලිකා ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය ආදී විවිධ ඉගැන්වීම් ක්‍රමවේද ඉතාමත් සාර්ථකව ග්‍රාහකයාට ධර්මාවබෝධය ලැබෙන ආකාරයෙන් භාවිත කර ඇත. එම ක්‍රමවේදවල සාර්ථකත්වය සෑම සූත්‍ර දේශනාවක් අවසානයේ ශ්‍රාවකයාගේ තෘප්තිය ප්‍රකාශයෙන් ගම්‍ය වේ.

මෙලෙසින් බුදුන් වහන්සේ විසින් භාවිත කරන ලද ඉගැන්වීම් ක්‍රමවේදවල විශේෂත්වය වන්නේ ඒවා ඕනෑම කාල පරාසයක දී භාවිත කළ හැකි වීමයි. එනම් සර්ව කාලීන අගයකින් යුක්ත වීමයි. මීට වසර 2600කට පමණ පෙර භාවිත කරන ලද ක්‍රමවේද නූතනයේ ද භාවිත කිරීම සඳහා රූසෝ, ඩුවි, ගාන්ධි, මොන්ටිසෝරි වැනි විවිධ දාර්ශනිකයින් නිර්දේශ කිරීමෙන් එහි කාලීන වටිනාකම පැහැදිලි වේ. එමෙන්ම එම භාවිත කරන ලද සියලු ක්‍රමවේද කිසිදු ආකාරයක බාධාවකින් තොරව පහසු හා සරල ආකාරයෙන් භාවිත කළ හැකි වීම ද සුවිශේෂත්වයකි.

ඒ අනුව බුදුන් වහන්සේ විසින් විවිධ ඉගැන්වීම් ක්‍රමවේද ධර්ම සන්නිවේදනයෙහි ලා භාවිත කර ඇති අතර ඒවා වර්තමාන පංති කාමරයේ දී ද කිසිදු ආකාරයක බාධාවකින් තොරව ඵලදායි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා යොදා ගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

**ප්‍රාථමික මූලාශ්‍රය**

*අපදානපාළි* (2006). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*අංගුත්තර නිකාය* (2006). (බු.ජ.මු.) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ඛුද්දක නිකාය* (2006). (බු.ජ.මු.) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝ නිකාය I* (2006). (බු.ජ.මු.) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකාය I* (2006). (බු.ජ.මු.) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකාය II* (2006). (බු.ජ.මු.) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකාය III* 2006). (බු.ජ.මු.) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිමනිකායට්ඨකථා* (2006). (බු.ජ.මු.) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*සංයුත්ත නිකාය* (2006). (බු.ජ.මු.) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

## ද්විතීයික මූලාශ්‍රය

අබේසේකර, හැරී හා අබේසේකර, විනීතා (2015). *බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ඉගැන්වීම් ක්‍රම*. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාසේන, එන්.වී. (2018). *ඉගැන්වීමේ ක්‍රම විද්‍යාව*. කොට්ටාව: සාර ප්‍රකාශන.

කුමාරපේලි, තිසර (2019). *ඉගැන්වීම*. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයකොඩි, චන්ද්‍රා (2005). *බුද්ධ දේශනාවෙන් ඉගැන්වෙන අධ්‍යාපන ක්‍රම ශිල්ප*. බලංගොඩ: තාරක ප්‍රකාශකයෝ.

ඤාණිස්සර හිමි, පාතේගම (2006). *බෞද්ධ අධ්‍යාපන ප්‍රවේශය*. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මකිත්ති හිමි, දොරලියද්දේ (2006). *සම්බුද්ධ දේශන විලාසය*. දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.

ධම්මතිලක හිමි, පැලැන්වත්තේ (2017). *බෞද්ධ අධ්‍යාපන දර්ශනය*. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නන්ද හිමි, ඇකිරියගල (1999). *බුදු දහමින් පිළිබිඹු වන ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම*. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රතනසාර හිමි, හැවැන්පොල (1969). *බෞද්ධ අධ්‍යාපන දර්ශනය*. කැළණිය: දීපා මුද්‍රණාලය.

වෙස්ට්වුඩ්, පීටර් (2008). *ඉගැන්වීමේ ක්‍රම. සිංහල පරිවර්තනය* - එන්.ජී. උපාලි චන්ද්‍රසිරි මුණසිංහ. කිරිඇල්ල: අධ්‍යාපන වෘත්තීය නිපුණතා සංවර්ධන කේන්ද්‍රය.

සිරිසීවලී හිමි, බඹරන්දේ (2003). *අධ්‍යයන කලාව*. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනාධීර, සිල්වි හා වනසිංහ, ශාමින්ද (2006). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණය සඳහා දාර්ශනික මාර්ගෝපදේශ*. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.